www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුරුම මිලිටරිය පුපුරා යන විරෝධතාවයන් මත කඩා පනී

## Burmese military cracks down on escalating protests

**සුජීව අමරනාත් විසිනි**
**2007 සැප්තැම්බර් 27**

බුරුමයේ (මියන්මාරයේ) මිලිටරිය, ජුන්ටාවේ මර්දනකාරී පාලනයට එරෙහිවත් ඒ සමග ම කම්කරු පන්තියේ පුලුල් ස්තරයන් හට ජීවන බර දරා ගත නොහැකි තත්වයකට ඇද දැමූ මිල ඉහල දැමීම්වලට එරෙහිවත් වැඩිවෙමින් ඇති විරෝධතාවයන් නවතා දැමීමට අන කරමින් ඊයේ දිනයේ දී එහි හමුදා භටයන් නිරායුධ විරෝධතාකරුවන් මත මුදා හැරියේ ය.

මීට පෙර අගනගරයව පැවති රැන්ගුන්හි (යැංගෝන්) බෞද්ධ භික්ෂුන් විශාල ප්‍රමානයක් ද ඇතුලත්ව විරෝධතාකරුවන් මිලිටරියේ විරෝධය නොතකමින් මාර්ගවලට අවතීර්න වූ විට ගැටුම් මාලාවක්ම පැන නැගුනි. ජුන්ටාව අඟහරුවාදා වන විට, රැන්ගුන් හා රටේ දෙවන විශාලතම නගරය වන මැන්ඩලේහි මුලු රාත්‍රී කාලය පුරාවට ම ඇඳිරි නීතිය පැනවූ අතර පුද්ගලයින් පස් දෙනෙකුට වඩා එක් රැස් වීම තහනම් කරනු ලැබිනි. විරෝධතා මධ්‍යස්ථාන බවට පත්ව තිබූ බෞද්ධ ආශ්‍රම අවට ප්‍රදේශ ද ඇතුලුව අනෙකුත් මර්මස්ථානයන් හි දැඩි ලෙස සන්නද්ධ වූ හමුදා සේනාංක රැඳවූහ.

රැන්ගුන්හි විරෝධතාකරුවන් හා ආරක්ෂක හමුදා අතර හටගත් ගැටුම්වලින් අඩුම තරමේ එක් විරෝධතාකරුවකු වත් මිය යන්නට ඇතැයි රාජ්‍ය මාධ්‍ය ඊයේ වාර්තා කලේ ය. නම හෙලි නොකල එක් නිලධාරියෙක් ඒඑෆ්පී පුවත් සේවයට ප්‍රකාශ කලේ පුද්ගලයන් තිදෙනෙකු මියගොස් ඇත යන්නයි." එක් අයෙක් සොල්දාදුවෙකුගෙන් රයිෆලය උදුරාගැනීමට තැත්කල පසු මරා දැමුනු අතර අනෙක් දෙදෙනා මිය යන තුරු පහර දීමකට ලක්ව ඇත. නොයෙක් පුද්ගලයින්ගෙන් හා විරුද්ධ පක්ෂ කන්ඩායම්වලින් ලැබෙන අනෙකුත් වාර්තා මෙම සංඛ්‍යා මීට වඩා ඉහල යාහැකි බව දක්වයි. වාර්තාවන ආකාරයට තවත් 300 දෙනෙකු හිරබාරයට ගෙන ඇත. ස්වෙදගොන් පැගෝඩා (විශාල ආශ්‍රම) භූමියට පිටතින් ගැටුම් හට ගත් නමුත් ඒවා 10,000ක් පමන යයි ගනන් බැලූ තරුන භික්ෂුන් හා ශිෂ්‍යයින් රැන්ගුන් හි වානිජ කලාපයේ පිහිටි යුලේ පැගෝඩා කරා පෙලපාලියකින් ගමන් කිරීම වලකාලන්නට අසමත් විය. සිය ගනනක් භටයින් අනතුරු සංඥා වෙඩි හා කඳුලු ගෑස් ගසා පසුව බැටන් පොලු ප්‍රහාරයක් සමගින් විරෝධතාවයට කඩා පැන්නා හ. සෙබලුන් පිරීගත් ට්‍රක් රථ ලුහුබඳිද්දී සිය ගනනක් පූජකයින් විරුද්ධ පක්ෂ නායක අවුන්සාන් සූකී රඳවාගෙන සිටින නිවසට ලඟා වීමට තැත් කලහ. මැංඩලේ හි දී 10,000ක පමන පිරිසක් විරෝධතාවයට එක් වූ බවට ගනන් බලා ඇත.

අගෝස්තු 15 දින එකවරම ඩීසල් මිල දෙගුන කිරීමටත් ස්වාභාවික ගෑස් මිල සියයට 500කින් ඉහල දැමීමටත් ජුන්ටාව තීරනය කිරීමේ පටන් විරෝධතාවයන් තීව්‍ර වෙමින් පවතී. දින කීපයක් තුලදී, ප්‍රවාහන වියදම් සීග්‍රයෙන් ඉහල යාම හේතුවෙන්, අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන්ගේ මිල ගනන් සියයට 10 සිට 50 දක්වා ප්‍රතිශතයකින් ඉහල ගොස් ඇත. බිත්තර, ආහාර පිලියෙල කිරීමට ගන්නා තෙල් හා සත්ව නිෂ්පාදන සියයට 35ක සාමාන්‍ය අගයකින් ඉහල ගොස් ඇත. ඉන්ධන තෙල් මත ඒකාධිකාරයක් පවත්වා ගෙන යන පාලන තන්ත්‍රය පෙරදී මිල සහනාධාරයක් ලබා දී තිබුනි.

මුල දී, ශිෂ්‍යයින් විසින් සංවිධානය කරනු ලැබ අගෝස්තු 19 දින ඇරඹුනු, මෙම පෙලපාලි ඉතා කුඩා පරිමානයේ විය. ඒ කෙසේ වෙතත්, මෙම පෙලපාලි අත් අඩංගුවට ගැනීම් හා පොලිස් සාහසිකකම් මධ්‍යයේ දීත් වඩා වර්ධනය වෙමින් පවතී. සති අන්තයේ දී රැන්ගුන් හි විරෝධතාවයට දස දහස් ගනනින් ජනතාව සහභාගී විය. සඳුදා වන විට, මැන්ඩලේ, සිට්වේ හා හකෝකු ද ඇතුලුව අඩුම තරමින් නගර 25ක විරෝධතාවයන් පැවැත්විනි. රැංගුන්හි පෙලපාලියට 50,000ත් 100,000ත් අතර ප්‍රමානයක් සහභාගි වූ බවට ගනන් බලා ඇත.

මෙම විරෝධතාවයන් බොහෝ සෙයින් ම 1988 දී මිලිටරි ඒකාධිපතිත්වයට අභියෝග කරමින්, ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් ඉල්ලමින් හා ඉහල ජීවන තත්වයන් ඉල්ලමින් පෙලගැසුනු ශිෂ්‍යයින්, කම්කරුවන් භික්ෂුන් හා නාගරික සහ ග්‍රාමීය දුගීන් මැදිහත් වූ සුවිසල් විරෝධතාවයන්ගේ පටන් ඇති වූ විශාලතම විරෝධතා වේ. සිය ගනන් විරෝධතාකරුවන්ට වෙඩි තබමින් ද විරුද්ධ පක්ෂ නායකයින් සිරගත කරමින් ද මොනම

ආකාරයක වුවත් දේශපාලන විරුද්ධත්වය පාගා දමමින් ද හමුදාව ප්‍රතිචාර දැක්වී ය. මිනිසුන් 3000ක් පමන මිලිටරිය මගින් මරා දැමුනු අතර, බොහෝ දෙනෙක් රඳවා ගැනීමට හා වධ හිංසාවලට ලක් කෙරුනි.

ජුන්ටාවේ ආගමික කටයුතු පිලිබඳ ඇමති, බ්‍රිගේඩියර් ජෙනරාල් තුරා මයිං මාවුං, රාජ්‍ය ගුවන්විදුලියෙන් කතා කරමින් විරෝධතාවයන් පිටුපස සිටින "විනාශකාරී කොටස්" වලට චෝදනා කල අතර "නීතියට අනුව භික්ෂූන්ට එරෙහිව පියවර ගන්නා බවට" අනතුරු හැඟවී ය. අඟහරුවාදා වන විට සූකීගේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජාතික ලීගයේ (එන්එල්ඩී) ජ්‍යෙෂ්ට නායකයකු වන යූ වින් නෙයින් ද පාලන තන්ත්‍රය අපහාසයට ලක් කිරීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියක් උසුලන ජනප්‍රිය විකට රංගන ශිල්පියෙකු වන සාගනාර් ද පොලීසිය විසින් අත් අඩංගුවට ගැනුනි. සාගනාර් විරෝධතාවයට එක් වන ලෙස ජනතාවට ආයාචනා කර තිබුනි. ඊයේ දිනයේ දී ප්‍රහාර වඩාත් තීව්‍ර කර තිබුනි.

ජාත්‍යන්තර මාධ්‍ය වර්තමාන විරෝධතාවයන් තුල බෞද්ධ භික්ෂූන්ගේ භූමිකාව උලුප්පා දක්වා තිබේ. ඒ කෙසේ වෙතත්, ඔවුන්ගේ මේ කැපී පෙනීම විරෝධතාවයන්හි අනවධානයකින් සිටිනවා මෙන් යයි පෙනෙන සූකී හා අනෙකුත් එන්එල්ඩී නායකයින්ගේ බියසුලු හා මධ්‍යස්ථ භාවයේ ප්‍රතිඵලයකි. ජුන්ටාවට අභියෝග කිරීමට එලඹීමට නොව එන්එල්ඩී විරෝධතාවයන් සීමා කිරීමටත් එසේම ජුන්ටා ජෙනරාල්වරුන් සමග සමාදාන වීම සඳහාත් කේවල් කිරීමට ඒවා අනිසි සේ යොදා ගැනීමටත් බලාපොරොත්තු වේ. බ්‍රිතාන්‍යයේ පලවන ටයිම්ස් පුවත්පත ඊයේ "ජුන්ටාව තමන් ම නිල වසයෙන් නම් කරගත්තේ රාජ්‍ය සාම හා සංවර්ධන කවුන්සිලය කඩා කප්පල් කිරීමට මග පාදන කිසියම්ම සිදු වීමක් වලක්වා ගැනීමේ අටියෙන් රංගුන්හි විරුද්ධ පක්ෂ නායකයන් විරෝධතාවයන්ගේ ශක්තිය පාලනය කිරීමට ඉමහත් පරිශ්‍රමයක් දරයි. මොවුන් පාලන තන්ත්‍රය පෙරලා දැමීමට අවශ්‍යව ඇති රැඩිකලුන් හා සාමාන්‍ය බුරුම ජාතිකයන් තැති නොගන්වමින් යහ පැවැත්මේ ආධිපත්‍යයෙන් සියල්ල යටපත් කර ගෙන සිටීම ඉතාම වැදගත් කාරනාව යයි විශ්වාස කරන මාධ්‍යමිකයන් අතර භේදයක් ඇති වේ යයි බිය වී සිටී." යි වාර්තා කලේ ය.

එන්එල්ඩීයේ නායක සාන් අවුං, "මිලිටරි පාලන තන්ත්‍රය පෙරලා දැමීමට කලබල විය යුතු නැහැ. එසේ කලොත් මිලිටරියේ ප්‍රහාරයෙන් තව තවත් හෙම්බත් වී , ජනතාව මේ ව්‍යාපාරයට සම්බන්ධ වීමට අකැමති වේවි"යි ටයිම්ස් පුවත්පතට පැවසී ය. මේ පුවත්පත එලෙසින් ම ජ්‍යෙෂ්ට භික්ෂූන්ගේ ඉල්ලීම්වල සීමාසහිත බව පෙන්වා දී තිබුනි: පාලන තන්ත්‍රය මගින් සිදු කරන අපයෝජන පිලිබඳව සමාව ගැනීම, ඉක්මන් මිල අඩු කිරීමක්, දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම හා ජුන්ටාව සමග දේශපාලන සාකච්ඡාවක්.

කෙසේ වෙතත් හික්මවා ගැනීම සඳහා වන මේ ඉල්ලීම්, තව දුරටත් මිලිටරිමය මැඩ පැවැත්වීම්වලට දොර විවර කරන්නේ ම ය. සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ කෝපය සීමා කරවීම තුලින් විරුද්ධ පක්ෂ නායකයින්, විරෝධතාවයන්ට එරෙහි ව ප්‍රහාරයන් දියත් කිරීමට ජෙනරාල්වරුන්ව දිරි ගන්වනවා පමනි. සූ කී හා එන්එල්ඩී මැතිවරනයක් පැවැත්වීමටත් විරෝධතාවයන් අවසන් කිරීමටත් ජුන්ටාව සමග එකඟවූ විට, 1988 දී ඇතිවූ සිද්ධීන්ගේ මූලික දේශපාලන පාඩම වූයේ ද මෙය ය. ජුන්ටාව මෙම එකලඟතාව දෙඅතින් ම වැලඳගෙන, ඔවුන්ගේ පාලනය ස්ථාවර කර ගත්තේ, ඉන් පසුව එන්එල්ඩීය අති විශිෂ්ට ජයක් අත් කර ගත් 1990 ඡන්දයේ ප්‍රතිඵල නොතකා හැරියේ ය.

දශක දෙකකට ආසන්න කාලයක් පුරාවට, එන්එල්ඩීයේ දර්ශනය ලෝක බලවතුන් පනවා ඇති සම්බාධකවල පීඩනය උපයෝගී කර ගෙන ජුන්ටාව සමග ගිවිසුමකට එලඹීමේ කාරනාවට සීමා කර ඇත. බුරුම ජනතාව සම්බන්ධයෙන් ඔවුන්ගේ සැලකිල්ල අවධානයට ලක් කල විට, එන්එල්ඩීය විදේශීය ආයෝජකයින් සඳහා සිය රට විවෘත කර දීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිවලට එකඟ වේ. මෙම වැඩපිලිවෙල සමග සම්පූර්නයෙන් ම අත් වැල් බැඳගෙන ජුන්ටාව පසුගිය මාසයේ දී ඉන්ධන සහනාධාර කපා දැමීම තුලින් එවැනි වැඩ පිලිවෙලක සමාජීය පලවිපාකයන් මොනවට පැහැදිලි කලේ ය.

අලුත්ම මිල ඉහලයාම්වලට පෙරාතුව පවා, උද්ධමනය සියයට 30 කටත් ඉහලින් පැවති අතර ජනගහනයෙන් සියයට 90ක් දරිද්‍රතාදර්ශකය වන දිනකට ඇමරිකානු ඩොලර් එකක ආදායමකට පහලින් විය. 450,000කින් සමන්විත හමුදාව වාර්ෂික ජාතික අයවැයෙන් සියයට 40ක් උරා ගනී. රැකියා විරහිත ආර්ථික විද්‍යා උපාධිධරයෙක්, "බොහෝමයක් දෙනාට ඔවුන්ගේ දරුවන් පාසල් යැවීමට නොහැකි වී තිබෙනවා. ඔවුන් දිනකට එක වේලක් පමනක් ගන්නා තත්වයට පත් වී තිබෙනවා. තත්වය ඒතරම් ම නරකයි. එහි ප්‍රතිඵලයක් හැටියට ඔවුන් මන්දපෝෂනයෙන් පෙලෙන අතර නිතරම ලෙඩින් වැටෙනවා. එහෙත් ඔවුන් හට රෝහල් ගාස්තු හෝ ගෙවීමට මුදල් සොයා ගැනීමට වත් බැහැ. අනිවාර්යයෙන්ම මීට පෙරත් අපිට දුෂ්කරතා තිබුනා, නමුත් මේ මිල ඉහලයාම් නිසා මිනිසුන්ගේ කොන්ද ම කැඩීගොස් තිබෙනවා. ජීවන කොන්දේසි අන්තෙට ම පිරිහිලා. මධ්‍යම පන්තිකයෝ දුපපතුන් වෙලා, ඒ එක්ක ම දුප්පත්තු අනාථයන් වෙලා" යයි සිඩ්නි මෝනිං හෙරල්ඩ් පුවත්පතට පැවසීය.

## ජාත්‍යන්තර නරුමත්වය

මේ මිලිටරියේ මර්දනය, ජනාධිපති බුෂ් විසින් මෙහෙයවනු ලැබුනු ලෝක නායකයින් ගෙනුත්, ඒ සමග ම ජාත්‍යන්තර මාධ්‍ය තුලත් උතුරු යන කුහකත්වයක් ජනනය කර ඇත. අඟහරුවාදා දින එක්සත් ජාතීන්ගේ මහ සභා රැස්වීම අමතමින්, බුෂ් බුරුම ජුන්ටාව හෙලා දුටු අතර නායකයන්ට එරෙහි නව පුද්ගල සම්බාධක පැනවීම, ප්‍රකාශයට පත් කලේ ය. ප්‍රන්ස ජනාධිපති නිකොලාස් සාර්කෝසි ජුන්ටාවට එරෙහිව යුරොපා සංගමය දැඩි දඬුවම් පැමිනවිය යුතු බවට තර්ක කරන අතර වාරයේ බ්‍රිතාන්‍ය අගමැති ගොර්ඩන් බ්‍රවුන් බුරුම පාලන තන්ත්‍රය "නීත්‍යානුකූල නොවන හා මර්දනකාරී" යයි හෙලා දැක්කේ ය. තත්වය සලකාබැලීමට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ හදිසි රැස්වීමක් දොරගුලු ලාගෙන ම රැස්වීය.

මේවායින් කිසිවකට බුරුම ජනතාව හා ඔවුන්ගේ අයිතිවාසිකම් පිලිබඳ කිසි ම තැකීමක් ඇතිවා නො වේ. දකුනු ආසියාවේ ම, බුෂ් පරිපාලනය පකිස්ථානු මිලිටරි ඒකාධිපති ජෙනරාල් පර්වේස් මුෂාරෆ් සමග සමීප සබඳතා පවත්වන අතර කාශ්මීරය තුල ඉන්දියාව පොලිස්-පරිපාලනයක් පවත්වාගෙන යාම ද පිලිබඳ ව ද, බංග්ලාදේශයේ මිලිටරි සහාය ලබන පාලන තන්ත්‍රයේ මර්දනකාරී වැඩ පිලිවෙල පිලිබඳව ද, දූෂ්ට ජාතිවාදී සිවිල් යුද්ධයක් පවත්වාගෙන යන ශ්‍රී ලංකා ආන්ඩුවේ ඒකාධිපති ක්‍රම වේදයන් කෙරෙහි ද රාජ්‍ය තන්ත්‍රික නිශ්ශබ්දතාවයක් දක්වයි. වොෂින්ටනය බුරුම ජුන්ටාවට එරෙහි වන්නේ එහි මර්දනකාරී ක්‍රමවේදයන් නිසා නොව එය චීනය සමග දක්වන එකඟත්වය හේතුවෙනි. බුරුමය භූලෝපායිකව චීනය හා ඉන්දියාව අතර ද නිරිතදිග ආසියාව අසල්වාදසීව ද විශේෂයෙන්ම මලක්කා සමුද්‍ර සන්ධිය ඇතුලත් ප්‍රධාන නැව් මාර්ග ආසන්නයෙන් ද පිහිටා ඇත. තක්සේරු කර ඇති ආකාරයට ඝන මීටර ට්‍රිලියන තුනක ස්වභාවික ගෑස් ද බැරල් බිලියන තුනක බොර තෙල් ද ඇතුලුව සැලකිය යුතු ප්‍රමානයක ස්වභාවික සම්පත් බුරුමය සතුව පවතී.

බීජිනයට, බුරුමය ඉතාමත් වැදගත් භූලෝපායික හා ආර්ථික සහකරුවෙකි. චීනය මිලිටරියට ආයුධ හා රාජ්‍යතාන්ත්‍රික සහයෝගය ලබා දෙන අතර රටේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලට සම්බන්ධ වී සිටියි. අනෙක් අතට, බුරුම වරායන් හා මිලිටරි කඳවුරු වෙත භූලෝපායික ප්‍රවේශයකුත් එමෙන් ම රටේ තෙල් හා ගෑස්වලට අයිතියත් බීජිනය බලාපොරොත්තු වේ. මේ වසරේ මුල් මාස හතක කාලය තුල, ගිය වසරේ එම කාල සීමාවට සංසන්දනාත්මකව වන විට සියයට 39.4ක වර්ධනයක් සහිතව චීන-බුරුම වෙලඳම් ඇමරිකානු ඩොලර් බිලියන 1.1ත් පසු කර ඇත.

හැරත් චීනය හා ඉන්දියාව අතර බුරුමය තුල අධිකාරය දැරීමට නැගී එන තරගයක් පවතී. ඉන්දියානු නිලධාරින්ගේ ඉහල මට්ටමේ බුරුම චාරිකා ඉහල යමින් පවතී. ද්වීපාර්ශවීය වෙලඳම් ද වැඩිවෙමින් පවතින අතර ජුන්ටාවේ ප්‍රසාදය දිනා ගැනීම පිනිස ඉන්දියාව නය හා ආධාර දී ඇත. 2004 දී වසර 24 ක කාලයක් තුල ඉන්දියාවට පැමිනි ප්‍රථම බුරුම රාජ්‍ය නායකයා බවට පත් වූ ජුන්ටාවේ නායක තාන් ශ්වේ හට රතු පලස් එලා ආචාර දක්වනු ලැබී ය. මේ වසරේ දී, ඕඑන්ජීසී නම් ඉන්දියානු තෙල් සමාගම බුරුම තෙල් ලබා ගැනීමට ලංසු තැබූ මුත් පෙට්රෝ-චයිනා සමාගමට පසුගිය මාසයේ දී පරාජය විය. තායිලන්තයත් ඇමරිකානු ඩොලර් මිලියන 6ක් අති විශාල බුරුම ජල විදුලි බල ව්‍යාපෘතියක ආයෝජනය කර ඇත.

විශේෂයෙන් එක්සත් ජනපදයේ ඒවා ද ඇතුලුව මෑත කාලීනව පලවූ ලිපි පෙලක් ම, ජුන්ටාව සම්බන්ධයෙන් චීනයට චෝදනා කල යුතු බවත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට බල කල යුතු බවත් වක්‍රෝක්තියෙන් දක්වන මුත්, වැඩි වැඩියෙන් එක්සත් ජනපදයේ මිත්‍ර පාර්ශවයක්ව පවතින ඉන්දියාව සම්බන්ධයෙන් හෝ තවත් මිලිටරි ඒකාධිපතිත්වයක් වන, එක්සත් ජනපදයේ නිහඬ පිටුබලය ලබන තායිලන්තය සම්බන්ධයෙන් හෝ එවන් අදහසක් දැක ගන්නට නැත. බුෂ් පරිපාලනයේ "ප්‍රජාතන්ත්‍රවාදය" සඳහා වන මෙම ආයාචන එක්සත් ජනපද ගැති පාලන තන්ත්‍රයක් බුරුමය තුල අටවාගැනීම සඳහා බලකිරීමට කරන ව්‍යාජ හේතු දැක්වීමක් වේ.

එක්සත් ජනපද පරිපාලනය බුරුම ජනයාට සලකන ආකාරය එය ඉරාක ජනයාට දක්වන සැලකිල්ලට වඩා කිසි සේත් වෙනස් නොවනු ඇත. වොෂින්ටනය පැත්තෙන් ගත් කල බුරුම ජුන්ටාව පෙරලා දැමීම වනාහී කලාපය තුල ප්‍රධාන ආර්ථික හා භූලෝපායික ප්‍රතිමල්ලවයකු වසයෙන් නැගී එන චීනය වට ලෑමේ ද එක්සත් ජනපද සංගතයන් හට බුරුම ස්වාභාවික සම්පත් හා ලාභ ශ්‍රමයට ප්‍රවේශය ලබා ගැනීමේ ප්‍රයත්නයක් ද වන්නේ ය.